# *සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව*

## නිවාඩු කාලීන පැවරුම්

## විෂය සමගාමී ක්‍රියාකාරකම් ~ 3 ශ්‍රේණිය ගණිතය


## සැකසුම: W.D.G.M.ටිකිරි සිරි කුමාරි

## දෙහිඕවිට අධ්‍යාපන කලාපය,


*අද අපි ගණිත ක්‍රීඩාවක් කරමු.*

**1. <u>100න් කීයද ? සෙල්ලම කරමු.</u>**

- **අවශ්‍ය දේ: පහත සදහන් නෝට්ටු වර්ග හතර සොයා ගන්න.**











(රුපියල් 20/ රුපියල් 50/ රුපියල් 100/රුපියල් 500)

- දුවේ,පුතේ නිවසේ සිටින වැඩිහිටි අයෙකු ගේ උදවු ලබා ගන්නත් වෙනවා.
  ක්‍රීඩාව සිදුකරන ආකාරය
- සපයා ගත් නෝට්ටු හොදින් නිරීක්ෂණය කරන්න .එකින් එක වෙන වෙනම. පහත ප්‍රශ්නවලට පිළිතුරු සොයාගන්න.

1. නෝට්ටු වේ ප්‍රධාන වර්ණය කුමක්ද?
2. ඉලක්කමෙන් සටහන් කර තිබෙන වටිනාකම කීයද?
3. අකුරෙන් සටහන් කර තිබෙන වවටිනාකම කීයද ?
4. නිකුත් කළ දිනය කුමක්ද?
5. අත්සන් තබා ඇති පුද්ගලයින් කවුද?

- දැන් දුවේ, පුතේ එක් නෝට්ටුවක් අතට ගන්න. ඉහත ප්‍රශ්න පහට පිළිතුරු ඒ නෝට්ටුව නිරීක්ෂණය කර සොයාගෙන මතක තබා ගන්න.

- දැන් එම නෝට්ටුව ක්‍රීඩාව සඳහා ඔබ සහභාගී කර ගත් අනෙක් කෙනාට දෙන්න.ඔබ සොයා ගත් පිළිතුරු එකින් එක පවසන්න. නිවැරදි දැයි බලන්නප් කියන්න.

- නිවැරදි එක් පිළිතුරකට ලකුණු 20ක් ලැබෙනවා.ප්‍රශ්න පහටම නිවැරදි පිළිතුරු දුන්නොත් ලකුණු 100යි නේද ?100න් කීයද ? 100න් 100යම ගන්න පුලුවන් නේද ? ලකුණු කීය ගත්තත් ඔබ දිනුම්. නෝට්ටු පහම ක්‍රීඩාවට යොදා ගන්න.